**DP/G5/2026p**

මගේ අංකය : 6/5/ශිෂ්‍යත්ව/2026
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

2026 මාර්තු මස 26 දින

සියලුම විදුහල්පතිවරුන් වෙත,

**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට**
**5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2026**
**අයදුම්පත් කැඳවීම**

උක්ත විභාගය 2026 අගෝස්තු මස 09 දින පැවැත්වීමට තීරණය කර ඇත. ඒ අනුව මෙම වර්ෂයේ ඔබ පාසලෙන් විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන්, මාර්ගගතව (online) විභාගයට අයදුම්කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය උපදෙස් සහ 2026 වර්ෂයට අදාළ ව්‍යවස්ථාව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් බාගත කර ගැනීමට අවස්ථාව ලබා දී ඇත. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026.04.30** වන දින වේ.

02. **පද්ධතියට ප්‍රවේශ වීම සහ උපදෙස්**

අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා,

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, නිල වෙබ් අඩවිය (**www**.doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "Exam Information Centre" මත (Click) කිරීම මගින්

**හෝ**

- https://onlineexams.gov.lk/eic වෙත පිවිසීමෙන් පසු.

2.1 ලැබෙන ප්‍රවේශ කවුළුවේ, දැනටමත් ඔබට ලබාදී ඇති පරිශීලක නාමය (User Name) හා මුරපදය (Password) ඇතුළත් කර පද්ධතියට ප්‍රවේශ වන්න.

2.2 Scholarship Examination For Grade 5 Students - 2026, Student Registration (Schools) තේරීමෙන් අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා ගත හැකි ය.

2.3 අයදුම්කරුවන්ගේ තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීමට පෙර ඔබ පාසලට අයත් මුහුණතෙහි (Profile) සඳහන් විදුහල්පතිගේ නම, දුරකථන අංක ආදී තොරතුරු යාවත්කාලීන කිරීම අනිවාර්ය වේ.

03. **අයදුම්කිරීම සඳහා සුදුසුකම්**

ව්‍යවස්ථාවට අනුව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන්නේ අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ රජයේ **පාසලක හෝ** රජය විසින් අනුමත පෞද්ගලික පාසලක 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන, 2017.01.31 දිනට පෙර උපත ලද සිසුන් පමණි.

ඔබ විද්‍යාලයෙන් දෘෂ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/වෙනත් කායික හෝ මානසික ආබාධිත තත්ත්වයන් සහිත විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී අමතර තොරතුරු ඇතුලත් කළ යුතුය. මෙවැනි විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති සිසුන් වෙනුවෙන්

- රත්මලාන අන්ධ විදුහල, රත්මලාන
- පොලොම්මාරුව අඳ බිහිරි විදුහල, තංගල්ල
- නහීල්ඩ් විදුහල, කයිතඩි.

විශේෂ විභාග මධ්‍යස්ථාන සහ වෙනත් සුදුසු මධ්‍යස්ථාන පිහිටුවීමට සලකා බලනු ලැබේ.

## 04. **අනන්‍යතා අංකයක් ලබාදීම**

4.1 මෙම විභාගය සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ දත්ත ඇතුළත් කරන අවස්ථාවේ අයදුම්කරුවන් සඳහා ඔබ විසින් අනන්‍යතා අංකයක් (Unique Identity Number) ලබා දිය යුතු ය.

4.2 විභාග දෙපාර්තමේන්තුවෙන් ඔබ පාසල සඳහා ලබා දී ඇති පරිශීලක නාමය (User Name) සමග ඉලක්කම් 8 කින් සමන්විත වන ලෙස අනන්‍යතා අංකය ඔබ විසින් නිර්මාණය කර ගත යුතු වේ.

4.3 ඔබේ පාසලේ පරිශීලක නාමය (User Name) අංක 4 කින් සමන්විත නම්, මුලට 9 ඉලක්කම සමග පරිශීලක නාමය යොදා අනන්‍යතා අංකය සැකසිය යුතු ය. පහත උදාහරණ බලන්න.

1. පරිශීලක නාමය (User Name) 09322 නම්, අයදුම්කරුගේ අනු අංකය 1 වන විට අනන්‍යතා අංකය 99322001 වේ.
2. පරිශීලක නාමය (User Name) 04354 නම්, අයදුම්කරුගේ අනු අංකය 10 වන විට අනන්‍යතා අංකය 94354010 වේ.
3. පරිශීලක නාමය (User Name) 01240 නම්, අයදුම්කරුගේ අනු අංකය 101 වන විට අනන්‍යතා අංකය 91240101 වේ.

4.4 ඔබේ පාසලේ පරිශීලක නාමය (User Name) අංක 5 කින් සමන්විත නම් මුලට පරිශීලක නාමය පමණක් යොදා අනන්‍යතා අංකය සැකසිය යුතු ය. පහත උදාහරණ බලන්න.

1. පරිශීලක නාමය (User Name) 14129 නම්, අයදුම්කරුගේ අනු අංකය 1 වන විට අනන්‍යතා අංකය 14129001 වේ.
2. පරිශීලක නාමය (User Name) 22300 නම්, අයදුම්කරුගේ අනු අංකය 10 වන විට අනන්‍යතා අංකය 22300010 වේ.
3. පරිශීලක නාමය (User Name) 30012 නම්, අයදුම්කරුගේ අනු අංකය 101 වන විට අනන්‍යතා අංකය 30012101 වේ.

## 05. **ශිෂ්‍යාධාර ලබා ගැනීම සඳහා අවශ්‍ය ආදායම් තත්ත්වය සහතික කිරීම**

5.1 අයදුම්කරුවන් ශිෂ්‍යාධාර අපේක්ෂා කරන්නේ නම් ඔවුන්ගේ දෙමාපියන් / නීත්‍යානුකූල භාරකරුවන් සියලු ම මාර්ගවලින් වර්ෂයකට රු. 180,000.00 හෝ ඊට අඩු ආදායම් ලබන අය විය යුතු ය.

5.2 රජය මගින් ක්‍රියාත්මක කරන "අස්වැසුම" වැඩසටහන මගින් ලැබෙන ප්‍රදානයන් මෙම ආදායම් සීමාවට බලපානු නොලැබේ.

5.3 මෙම සුදුසුකම් සනාථ කිරීම සඳහා වාර්ෂික ආදායම පිළිබඳව ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ආදායම අඩු හෝ වැඩි ලෙස සඳහන් ලේඛන පදනම් කරගත යුතු අතර එම ලේඛන ආරක්ෂා සහිතව ගොනුකර තැබිය යුතු ය.

5.4 විභාග ප්‍රතිඵල අනුව ශිෂ්‍යාධාර ලැබීමට සුදුසුකම් ලැබුවහොත් නැවත ආදායම සහතික කිරීම අවශ්‍ය නොවනු ඇත.

5.5 **දෙමාපියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ ආදායම නිවැරදිව ඇතුළත් කිරීම විදුහල්පතිගේ වගකීමකි.**

5.6 මේ පිළිබඳව පසුව කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකියාවක් නොමැති බැවින් ආදායම් තත්ත්වය පිළිබඳව අදාළ තොරතුරු නිවැරදි බවට දෙමාපියන්ගෙන් තහවුරුවක් ලබා ගැනීම ඉතා වැදගත් වේ.

## 06. **ශිෂ්‍යාධාර හිමිකම සඳහා අදාළ වයස් සීමාව**

ශිෂ්‍යාධාර ලැබීමට හිමිකම් ලබන්නේ 2016.02.01 දින සිට 2017.01.31 දින දක්වා කාලය තුළ උපත ලද දැනට 5 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අඩු ආදායම් සහිත සිසුන් පමණක් බව දෙමාපියන්/නීත්‍යානුකූල භාරකරුවන් කල් ඇතිව දැනුවත් කළ යුතුය. මේ පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ලේකම් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා රෙගුලාසි අදාළවන බව සලකන්න.

07. **පද්ධතියට උඩුගත කරන ලද තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම**

7.1 මාර්ගගතව (online) පමණක් පද්ධතියට තොරතුරු උඩුගත (upload) කිරීමෙන් පසු තම පාසලේ අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත් මුද්‍රිත පිටපතක් (PDF) ලබාගත යුතුය. එහි සඳහන් තොරතුරු සහ පද්ධතියට උඩුගත (Upload) කිරීම සඳහා භාවිත කළ අයදුම්කරුවන්ගේ තොරතුරු ලේඛනය සමග **එකින් එක පරීක්ෂා කර බලා** නිවැරදිව තොරතුරු ඇතුළත් කර අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවට තහවුරු කර ගැනීම අනිවාර්ය බව අවධාරණය කරමි.

7.2 **එහිදී සම්පූර්ණ නම, උපන් දිනය, මාධ්‍යය, ස්ත්‍රී / පුරුෂ භාවය සහ ආදායම් තත්ත්වය යනාදී සියලු ම තොරතුරු නිවැරදිව ඇතුළත් වී ඇත්දැයි පරීක්ෂා කර බලා තහවුරු කර ගන්නා ලෙස දෙමාපියන් / භාරකරුවන් හට උපදෙස් ලබා දිය යුතුය.**

7.3 සමූහයකගේ දත්ත ඇතුළත් කිරීම (Bulk upload) සඳහා ඔබ වෙත ලබාදී ඇති Excel ආකෘතිය download කර **එයට පමණක්** තොරතුරු ඇතුළත් කර පද්ධතියට උඩුගත **(upload)** කරන්න. වෙනත් ආකෘති භාවිත කිරීමෙන් වළකින ලෙස අවධාරණය කරන අතර එසේ වුවහොත් ඔබ විසින් ඇතුළත් කරන තොරතුරුවල නිවැරදිතාවය පිළිබඳ ගැටලු ඇති විය හැකි ය.

7.4 එලෙස තොරතුරු නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් පසු **බාගත** (Download) කරගත් PDF පිටපතෙහි පමණක් අයදුම්කරුවන් හා දෙමාපියන් / භාරකරුවන්ගෙන් අත්සන් ලබාගෙන විභාග දෙපාර්තමේන්තුව විමසන අවස්ථාවක ඉදිරිපත් කිරීම සඳහා පාසලේ සුරක්ෂිතව තබාගත යුතුයි. (පාසලෙන් සකස් කර ගත් **(Excel Sheet)** පිටපතේ **අත්සන් ලබා ගැනීම නොකළ යුතුයි.)**

7.5 ඔබ විසින් අයදුම්පත් සම්පූර්ණ කිරීම ඉතාමත්ම නිවැරදිව සිදු කළ යුතුය. 2026.04.30 දින මධ්‍යම රාත්‍රී 12 න් පසුව මාර්ගගත වැඩසටහන වසා දමන අතර උඩුගත කරන ලද **අයදුම්කරුවන්ගේ තොරතුරු කිසිදු හේතුවක් මත වෙනස් කරනු නොලබන බැවින්** මුල් අවස්ථාවේදීම නිවැරදි තොරතුරු උඩුගත කිරීම විදුහල්පතිගේ හා විභාග විෂය භාර ගුරුවරයාගේ වගකීමක් බව දන්වමි.

7.6 අයදුම්කරුවන්ගේ තොරතුරු පද්ධතියට **ඇතුළත්** කර බාගත කර ගන්නා මුද්‍රිත(PDF) පිටපතෙහි පමණක් අයදුම්කරුවන්ගේ අත්සන් ලබා **ගැනීමෙන්** පද්ධතියට ඇතුළත් වී නොමැති අයදුම්කරුවන් හඳුනාගත හැකි වේ.

**සැ.යු. - පද්ධතියට ඇතුළත් කරන තොරතුරුවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් අදාළ විදුහලේ විදුහල්පති සහ විභාග විෂය භාර ගුරුවරයා පෞද්ගලිකව වගකිව යුතු බව අවධාරණය කරමි.**

08. **පහසු විභාග මධ්‍යස්ථානයක් ඉල්ලුම් කිරීම.**

**පසුගිය වර්ෂයේදී ඔබ පාසලේ අයදුම්කරුවන් පෙනී සිටි විභාග මධ්‍යස්ථානයට වඩා පහසු විභාග මධ්‍යස්ථානයක් ඇත්නම් එය වෙනස් කර දෙන ලෙස අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්න.**

ඉහත කරුණු සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු විමසීම සඳහා පහත සඳහන් දුරකථන අංකවලට අමතන්න.


දුරකථන අංක : **0112784537 / 0112784208 / 0112786616 / 0112785922 / 0112785413**

ෆැක්ස් අංකය (Fax) : **0112784422**

විද්‍යුත් ලිපිනය : gr5schexam@gmail.com


එච්.ජේ.එම්.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්